Page 4 October 2011.qxd 18/10/2011 16:38 Page 1



LANKA VITHTHI ලංකාවිත්ති OCTOBER 10, 2011 ඔක්තෝබර් මාසය

1 වන පිටුවෙන්.....

# වැරදුණු කුරුමානම

මහත් රුකුලක්ද වූයේය. යුද්ධය පවතිනා කාලය ඇතුළතද ද්‍රෝහීන් කළේ හමුදාව සහ රජය විවේචනය කිරීම ය. සිංහළයයි කියා ගන්නා ඇතැම් ලේඛකයෝ කොටින්ට හිතවත්කම් දැක්වූ NGO ඒකකයන් හි මුදලින් යැපෙන්නෝ වූහ. ඇතැමෙක් අද රට හැර ගොස් සිටිති. මොව්හුද දෙමළ ඩයස්පෝරාව මෙන් ශ්‍රීලංකා විරෝධී ක්‍රියාවන්ට පිටින් සිට සහයෝගය දෙති.

## පසුබිම සකස්කිරීම

මානව අයිතිවාසිකම් කඩ කළේය යන චෝදනා අප රජයට හා සන්නද්ධ හමුදාවන්ට එරෙහිව ගෙන ඒමට අවශ්‍ය පසුබිම සකස් කිරීමට කොටිනැට්ටේ උන්ද, බටහිර රටවල සිටින සමහර බංකොලොත් දේශපාලකයින්ද, මානව හිමිකම් NGO කාරයින්ද වහ වහා උත්සුක වූහ. විශේෂයෙන්ම මේවාට ඉදිරිපත් වූයේ බ්‍රිතාන්‍යයේ මීඩියාව සහ දේශපාලකයන් ය.

## චැනල් 4 නාලිකාව Channel 4

බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනී නාලිකාව මගින් විවිධ අවස්ථාවලදී යුද්ධයේ අවසාන සමයේ සිදුවූවායයි කියන සිද්ධීන් දක්වන කෙටි විඩියෝ පට විටින් විට පෙන්වන ලද අතර මෑතකදී ඝාතන භූමීන් (Killing Fields) යනුවෙන් අප රටට නිගාකරන අමූලික, විකෘතිකරන ලද, බොරු අඩංගු චිත්‍රපටයක් නිපදවා පෙන්වන ලදී. එහි රූප රාමුවල සහ හඬ පටවල පැහැදිලිව පෙනෙන නොගැලපීම් හා එම ජවනිකා නළුවන් යොදා රූප ගත කරන ලද රහපෑම් බවට ද විඩියෝ සහ සිනමා තාක්ෂණය පිළිබඳ විශේෂ දැනුම ඇති අය කරුණු පැහැදිලි කළත් චැනල් 4 කාරයෝ දිගින් දිගටම ඒවා පෙන්වූහ. මෙයට පෙර ප්‍රබුද්ධ ජනයාගේ විශ්වාසය දිනා සිටි චැනල් 4 නාලිකාව මෙසේ කටයුතු කළේ කොටි නැට්ටන්ගේ මුදල්වලට යටවී බවට ප්‍රචාරයක්ද ගියේය. බංකොලේත් බවට වැටී සිටි එම නාලිකාව කොටි මුදල්වලින් ගොඩගනු ලැබීයයිද කතාවක් පැතුරුණි. එය සබෑවක්ද විය හැකිය. මෙම චිත්‍රපටය මානව අයිතිවාසිකම් මණ්ඩල සැසිවාර වලදී ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් කාරයින් විසින් පෙන්වන ලදී.

NGO කාරයින් කෙරෙහි කොටිනැට්ටේ බලපෑම කොපමණ තීව්‍ර වීදැයි සිතාගත හැකිය. පෙර කාලයේ ඇම්නෙස්ටිකාරයින් සිය ව්‍යාපාරය සඳහා මුදල් සම්මාදම් කරගත්තේ පුවත්පත් වල සිය මෙහෙය ගැන දැන්වීම් පළකිරීමෙනි. දැන් එවැනි දැන්වීම් නැත්තේ මෙවැනි ත්‍රස්ත ව්‍යාපාර වලින් ඔවුන්ට මුදල් ලැබෙන නිසාදෝ යන සැකය මතුවේ.

## බැන්කි මූන්ගේ දරුස්මාන් වාර්තාව

මේ වසරේ මුල්කාලයේදී කොටි යුද්ධයේ අවසන් කාලයේ සිදුවීම් ගැන අපට චෝදනා නගමින් බටහිර රටවල් ව්‍යාපාර ගෙනගිය කාලයේ එක්සත් ජාතීන්ගේ ලේකම් බැන්කි මූන් එම සිදුවීම් පිළිබඳ තමන් දැනුම්වත් වීම පිණිස කරුණු සොයාබලා තමන්ට වාර්තාවක් ඉදිරිපත් කරන්නටයයි දරුස්මාන් නමැති ඉන්දුනීසියාවේ හිටපු ඇටෝර්නි ජෙනරාල්වරයෙකුගේ නායකත්වයෙන් යුතු තිදෙනෙකු පත්කළේ ය. මෙය බැන්කිගේ තනි කැමැත්තට පත් කළ අය මිස එක්සත් ජාතීන්ගේ කමිටුවේ අනුමැතිය පරිදි පත් කළ අය නොවේ. මොවුන් එහෙන් මෙහෙන් කරුණු සොයා අසා එළඹී තීරණ සහිත වාර්තාවක් ටික කලකින් බැන්කි මූන් වෙත ඉදිරිපත් කළෝය. මෙම මණ්ඩලය අප රට විසින් තරයේම ප්‍රතික්ෂේප කළ නිසා ඔවුන් ලංකාවට ආවේ වත් නැත. බැන්කි මේ වාර්තාව හොර රහසේ පිටකළේය. එහි අඩංගු කරුණු සහ එළඹී තීරණවලින් පැහැදිලිව පෙනී ගියේ එය කොටි නැට්ටේ උවමනාව පිට, කොටි ව්‍යාපාරයට හිතවත් විවිධ අයගේ සාක්ෂි මත සකස් වූවක් බවය. මෙය අප රටේ ප්‍රබුද්ධ විචාරකයින් විසින් විවේචනය කරන ලදුව ජනතාව විසින් තරයේ ප්‍රතික්ෂේප කරන ලද්දක් විය. මේ කාලයේ බැන්කි මූන් තම නිල සේවා කාලය අවසන් වී දෙවන වාරයක් සඳහා අපේක්ෂාවෙන් සිටි සමයකි. ඔහු එලෙස කටයුතු කළේ බටහිර රටවල බලපෑම් නිසා බව පැහැදිලිය. ඔහුගේ නිල කාලය දික් කිරීම බටහිර රටවලින් වලක්වාවියැයි බැංකි බය වූ නිසායයි සැක සිතේ.

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් 18 වන සැසි වාරය

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මානව හිමිකම් 18 වන සැසි වාරය 2011 සැප්තැම්බර් 12-30 දක්වා පැවැත්වුණි. එය රටවල් 47 කින් සමන්විත වූ අතර ශ්‍රීලංකාවද එක් නියෝජිත රටකි. මානව හිමිකම් පිළිබඳ විශේෂ මහින්ද සමරසිංහ



Robert Blake

ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ලංකා කණ්ඩායම ද එයට සහභාගි විය. ඉහත සඳහන් කළ දරුස්මාන් වාර්තාව මෙවර සැසි වාරයේදී බටහිර රටවල් විසින් සාකච්ඡාවට රිංගවීමට උත්සාහයක් ගැනීමට ඉඩ ඇති බවට සැකයක් තිබිණ. මේ ගැන අප නියෝජිතයින් විමසිල්ලෙන් සිටියාට සැක නැත.

සැසිවාරය ආරම්භක දිනයේදී සිය කතාව කළ සමරසිංහ මහතා යුද්ධයෙන් පසු අප රට ගෙන යන ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතු (Reconciliation & Rehabilitation) වල ස්වභාවය සහ ප්‍රගතිය පිළිබඳ පැහැදිලි කළේය. ඒ සමගම මෙම මානව හිමිකම් මණ්ඩලයේ මහකොම සාරිස් ධුරය දරණ නවනීදන් පිල්ලේ නමැති තැනැත්තිය සිය ධුරයේ වගකීම් පවා උල්ලංඝණය කරමින් අර දරුස්මාන් වාර්තාව මේ සැසිවාරයට රිංගවාලීමට ප්‍රයත්න කළ බවද පෙන්වා දී එයට විරෝධතාව ද පළකළේ ය.

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ නිළවාර්තාවක් නොවන එවැනි කිසිවක් එසේ රිංගවීමට තැත්කිරීම මානව හිමිකම් මණ්ඩලය පිළිබඳ විශ්වාසය බිඳවැටීමට තුඩු දෙන්නක් බව ද, මැය වැන්නන් අද ලංකාවට විරුද්ධව කරන්නාවූ මෙය හෙට වෙන ඕනෑම රටකට එරෙහිව වන්නක් විය හැකි බවද සමරසිංහ මහතා කීය. සම්ප්‍රදාය වනුයේ එවැනි පියවරක් ගැන්මට ප්‍රථම අදාළ රටට ඒ පිළිබඳව දැන්වීම ය.

ඒ ආකාරයෙන්ම ලංකාවේ ප්‍රතිසංධාන කටයුතු පිළිබඳව අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවක් කරලීමට කැනඩාව ගත් ප්‍රයත්නයද ශ්‍රීලංකා කණ්ඩායම විසින් ව්‍යවර්ථ කරන ලදී. නොවැම්බර් 15 දාට පිටවීමට නියමිත LLRC - උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමේ වාර්තාව - දැන් සාකච්ඡා කළ හැක්කේ කෙසේදැයි ඇසූ අප පිරිස, එය කළයුත්තේ ලබන මාර්තු සැසි වාරයේදී බවද පෙන්වා දුන්හ. කැනඩාව වැනි කොටිනැට්ටේ විශාල පිරිසක් සිටින රටකට මේ තදියම ඇත්තේ නැට්ටේ බලපෑම නිසා බව පැහැදිලිය. එසේම දකුණු අප්‍රිකාවෙන් එන නවනීදන් පිල්ලේ නම් ද්‍රවිඩ කාන්තාව ද මේ ක්‍රියා කරන්නේ කාගේ වුව මනාවටදැයි සිතාගත හැකිය. කැනඩාව කළ ප්‍රයත්නයද යුරෝපා සමූළ රටවල උදව් ලැබ කරන්නක් විය. මෙසේ විවිධ ප්‍රයත්නයන් බටහිර රටවල් කළද, ශ්‍රීලංකා නියෝජිත පිරිස විසින් මණ්ඩලයේ අනෙක් රටවල නියෝජිත පිරිසට අපරටේ තත්වය පිළිබඳව පැහැදිලි කිරීම් මුලසිටම ලබා දී තිබුණ බැවින්ද, බටහිර රටවලට සහයෝගයක් නොලැබුණ බැවින්ද, නැට්ටේ නියෝජිතයින් අකුලාගෙන පැත්තකට වූ බව පෙනිණ.

## රොබට් බ්ලේක් ලංකාවේ හොල්මන් කරයි

ජිනීවාහි මානව හිමිකම් මණ්ඩල සැසිවාරය තුළ කොටි නැට්ටේ නියෝජිතවරියගේ (පිල්ලේගේ) කාර්යය කිරීමට ප්‍රයත්න දැරූ ඒ දිනවලම දකුණු ආසියාවේ ඇමරිකානු සහකාර ලේකම් රොබට් බ්ලේක් ලංකාවට පැමිණ හොල්මන් කළේය. අප කොටි හා සටන් කරන සමයේදී රොබට් බ්ලේක් ශ්‍රීලංකාවේ ඇමරිකානු තානාපති වශයෙන් කටයුතු කළ, කුප්‍රකට වාර්තා ඇත්තෙකි.



Navi Pillai

ඔහු ආවේද ලංකාවේ ප්‍රතිසංධාන කටයුතු සෙවීමටය. ඔහු යුහුසුලුව අප රටේ සිටින කොටි නැට්ටන් වන TNA කාරයින් හමුවිය. එයට පසු උතුරේ කටයුතු සිදුවන ආකාර සොයමින් විශේෂයෙන්, උතුරේ සරසවි සිසුන් හමුවීමට ද ගියේය. සමහර තැන්වලදී ඔහුට වෙනත් ද්‍රවිඩ කණ්ඩායම් වල විරෝධයනට පවා මුහුණ දෙන්නට සිදුවීය.

මෙසේ රොබට් බ්ලේක් කැරකුණේ මානව හිමිකම් මණ්ඩලයේ බටහිර රටවල සහ කොටි නැට්ටන්ගේ ප්‍රයත්න සාර්ථක වේය යන විශ්වාසය උඩ ය. නමුත් ඒවා හරියන්නේ නැතැයි පෙනුණ විට ඔහු TNA ද්‍රවිඩ සංධානයේ මන්ත්‍රී වරුනට ජනාධිපති සමග සාකච්ඡා කොට සමථයකට එන ලෙස කියමින් හෙමින් පල්ලම් බැස්සේය.

මේ සිදුවීම් වලින් පෙනීයන්නේ අපගේ සතුරන් වන බටහිර රටවල්ද කොටි නැට්ටන්ද අපට වින කිරීමට නොනවත්වා කටයුතු කරන බවය. කොක්කෙන් කරන්නට බැරි දේ කෙක්කෙන් හෝ කරගන්නට බලන බවය.

## ශ්‍රීලංකාවේ වගකීම

අප ප්‍රතිසංධාන කටයුතු නොනැවතී කරගෙන යා යුතුය. අවුරුදු 20 ක් 30 ක් මොළේ සෝදනු ලැබුවා වූ උතුරේ ජනතාව එක රැයින් වෙනස් වන්නේ නැත. අප ඉවසීමෙන් ඒ අයට යථාර්ථය හඳුනාගැන්මටද, වෙල්වනායගම්ලා රෝපණය කළ ඊළාම් සිහිනය මැකී යාමට ද කල්දිය යුතු ය.

ලෝකයේ අන් රටවල් තුළ අප රටේ නියම තත්වය විදහාපාන චිත්‍රපට, විඩියෝ පට හා විස්තර පත්‍රිකා ආදියෙන් සමන්විත ප්‍රබල ප්‍රචාරක වැඩපිළිවෙලක් ගෙන යා යුතුය. දැනට රජය සාදා ඇති එවැනි දෑ තානාපති කාර්යාල මගින් ලොව පුරා ප්‍රචාරය කළ යුතුය. එසේම අප මුන්ගේ ඊළඟ පියවරවල් ගැන හොඳ සෝදිසියෙන් සිටිය යුතුය.

# ශ්‍රීලංකා-චීන සබඳතා

♦ මේජර් වී. බී. කරුණාරත්න
Oxford UK

චීනයේ නැති තරමටම චීන අවන්හල් (Chinese Restaurants) ශ්‍රීලංකාවේ ඇතැයි කියති. චීන දත්බඳින ස්ථාන, චීන රෙදි සාප්පු, චීන චර්ම වෛද්‍ය මධ්‍යස්ථාන, චීන කටු චිකිත්සාගාර (Chinese Acupuncture) බොහෝ නගරවල දක්නට ඇත. කොම්පඤ්ඤ වීදිය, මරදාන, ගාල්ල, මහනුවර වැනි නගරවල චීන ලේන් යනුවෙන් ප්‍රසිද්ධ වූ චීන ජාතිකයන් බහුතරයක් පදිංචිව සිටින වීදි ගණනාවක් ම ඇත. මීට වසර ගණනාවකට පෙර කොළඹින් බැහැර ගම් පෙදෙස්වලද, වතුකර පෙදෙස්වලද රෙදි වෙළඳා මේ යෙදුණේ චීන ජාතිකයන්ය. රෙදි පොට්ටනි කරෙන් ගෙන රෙදි වෙළඳාමේ ගිය චීන්නු ගමේ ප්‍රසාදය දිනාගත්හ.



බණ්ඩාරනායක මැතිණිය සහ මාවෝ සේතුං

ඉතා ගාම්භීර ලෙස කොළඹ හදවතෙහි ඉදිව ඇති අයස් කාන්ත ගොඩනැගිල්ල වූ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව චීන රජයෙන් ශ්‍රීලංකාවට ලැබුණු පරිත්‍යාගයකි. දකුණේ ගිංගඟ ගංවතුර වැලැක්වීමේ ව්‍යාපාරය, මින්නේරිය නූල්කැටීමේ කම්හල වැනි ව්‍යාපෘතිවලට චීනයේ ආර්ථික හා තාක්ෂණික දායකත්වය ලැබිණ. අද වන විටත් ශ්‍රීලංකාවට චීන රජයේ ආර්ථික ආධාර ලැබෙන බව පෙනේ. මහවැළියට පමණක් දෙවැනි වූ හම්බන්තොට වරාය, නොරෝච්චෝල් විදුලිබලාගාරය, සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය, කොළඹ සංස්කෘතික රංග ශාලාව ආදිය ඉදිකිරීමට චීනයේ මූල්‍ය ආධාර සහ තාක්ෂණික උපදෙස් නොඅඩුව ලැබේ. ගම්පොළ නුවර එළිය මාර්ගයේ රම්බොඩ දුර්ගය (Ramboda Pass) ප්‍රතිසංස්කරණයද, මාතර අධිවේගී මාර්ගයේ කොටසක්ද ඉදිකරනුයේ චීන සමාගම් මගිනි. කොළඹ හා හම්බන්තොට හෝටල් ඉදිකිරීමටද චීන ආයෝජකයෝ එකඟ වී ඇත.

ලංකා ආර්ථිකය හා සංවර්ධන ව්‍යාපාරය ටිකින් ටික චීනකරණය වෙමින් පවතී. ශ්‍රී ලංකා ඉතිහාසයේ චීන ජාතික ෆාහියන් භික්ෂුවගේ ලංකාගමනය සහ 1967 දී චීන දන්ත ධාතූන්වහන්සේ ශ්‍රීලංකාවේ ප්‍රදර්ශණය ආගමික වශයෙන් චීන ශ්‍රීලංකා සබඳතා පෙන්වූ සාධකයන්ය.

1956 බණ්ඩාරනායක රජය චීනය සමග තානාපති සබඳතා ඇරඹීය. 1957 වනවිට ලංකාවේ මැයි දිනය නිවාඩු දිනයක් කිරීමේ උත්සවයට චීන අගමැති චෞ එන්ලායි පවා සහභාගිවීමට තරම් දෙරට සබඳතා තීව්‍ර විය.

1950 දී ඇරඹී කොරියානු යුද්ධය නිසා වූ ආනයන අපහසුතා මත 1952 දී ලංකාවට විශාල හාල් හිඟයක් ඇතිවිය. ඒ සමගම අපේ රබර් වෙළඳාමද ඉතා පහතට වැටිණ. හාල් ලබාගන්නට අපට මුදල් නැතිවිය. ලංකා රජය හාල් ලබා ගන්නා මං සෙවූවාය. එහිදී අපට පිහිට වූයේ චීනයයි. අපට හාල් ලබාදීමට සහ අපේ රබර් ගන්නට චීනය එකඟවූවාය. ඒ අනුව අත්සන් කළ ගිවිසුම ප්‍රසිද්ධ වූයේ හාල් රබර් ගිවිසුම යනුවෙනි.

ලොව පංච මහා බලවතුන්ගෙන් කෙනෙකු



ජනාධිපති රාජපක්ෂ සහ චීන විදේශ ඇමති

වන චීනය අනෙකුත් රටවලට හානිදායක බලපෑම් නොකරයි. ලොව සිදුවන විවිධ රාජ්‍ය අරගලවල දී චීනය බොහෝ විට මධ්‍යස්ථ විය. චීනය යහපත් විදේශ මිතුරෙකි.

ඇතැම් අය පමණක් නොව ඉන්දියාව වැනි රටවල්ද සිතන්නේ සැක කරන්නේ චීනය ශ්‍රීලංකාවට උදව් කරන්නේ කිසියම් යටි අදහසක් ඇතිව බවය. ඒ සැකය කිසිසේත් සාධාරණ නැත. ශ්‍රීලංකාව පදනම් කරගත් දේශපාලන හෝ ආර්ථික ඉලක්ක චීනයට තිබිය නොහැකිය.

ලෝකයේ ශක්තිමත් රාජ්‍යයක් වීමට අවශ්‍ය ප්‍රධාන සාධක 5 ක් තිබේ. ඒවා නම් රාජ්‍යයක යුද, ආර්ථික, භූගෝලීය, සංස්කෘතික හා ජනතාව යි. මෙම සාධක සපුරා ගත් රාජ්‍යයන් අතර ඉදිරියෙන්ම සිටින්නේ චීනයයි.

2008 ඔලිම්පික් තරඟාවලියේ සත්කාරක රාජ්‍යය ලෙස චීනය විසින් කරන ලද සංවිධාන රටාව හා සංදර්ශණ රටාව මුළු ලොවම මවිත කරවීය. එවැනි අලංකාරයක් මින් පෙර පැවැත්වූ කිසිම ඔලිම්පික් උළෙලක තිබුණේ නැතැයි බොහෝ දෙනා කියති.

වසර ගණනාවක් තිස්සේ අද දක්වා චීන ගුවන් විදුලිය ශ්‍රීලංකාව වෙනුවෙන් සිංහළ භාෂාවෙන් වැඩසටහනක් සතිපතා ප්‍රචාරය කරයි. මේ දිනවල ශ්‍රීලංකාව චීනය හා එක්ව නාවික හමුදා අභ්‍යාස පවත්වති. අපේ සන්නද්ධ නිලධාරීහු චීනයේ පුහුණුව ලබති.

චීනය ශ්‍රීලංකාවේ ආර්ථික ආයෝජනවල යෙදීමෙන් විදේශ සබඳතා වර්ධනය වන අතර එය අපේ ආර්ථික හා සාමාජයීය සංවර්ධනයට රුකුලක් වෙනවා ඇත. චීනය යහපත් විදේශ මිතුරෙකු බව නොපැකිල කිව හැකි ය.